

## 'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු

| 59 වන කාණ්ඩය | බු.ව. 2560 ඇසළ මස පුරපසළොස්වක ද ව්‍ය.ව. 2016 ජුලි මස 19 වන ද | 03 වන කලඹ |
|---|---|---|



# ආගම ඉගෙනීමේත් පිළිපැදීමේත් උනන්දුව

අතිපූජ්‍ය පැළෑනේ සිරි වජිරඤාණ මහානායක
මාහිමිපාණන් වහන්සේ විසිනි

අපට ලැබී තිබෙන ආගම ධර්මය කොයි තරම් උසස් ද? න්‍යායානුකූල ද? පණ්ඩිත ගෝචර ද? ප්‍රඥාභිවර්ධනයට හේතු ද? මෙ ලොව ශ්‍රී සමෘද්ධිය හා නිරාමිෂ ප්‍රීතියත් නිදහසත් සලසා ගැනීමට අනුන් ගේ සහායක් නැති වැ සිය අත් බව ඉබේ ම දමනය කැර ගැනීමටත් මේ විෂම වූ ලෝකයෙහි නො සැලී සම වැ හැසිරෙමින් අනුනුත් නො පෙළා තමනුත් නො පෙළී කල් යැවීමෙහි පුහුණු වීමටත්, පරලෝකාර්ථයට හා හැම ලෝකයක් ඉක්මැ ගිය ලෝකෝත්තරාර්ථයට නොවරදනා හරිමඟ යොදා ගැනීමටත් එක ම උපකාරය ධර්මය නො වේ ද යන බවත් සිතා බලන අය දැන් මෙරටැ ගිහියන් අතර තබා, පැවිද්දන් අතරත් ඉතා ම හිඟ වී ගෙන යන බව පෙනේ. බණ ඇසීමට බණ පත් පොත් ඉගෙනීමට දක්වන අරතියෙන් (-නො ඇල්මෙන් = එපාකමෙන්) ඒ බව හෙළි වේ. පාසල්වලත් ආගම ඉගැන්වීමෙහි ගුරුවරුන් හා මවු පියන්ගේ උදසීනත්වය නොසැලකිල්ල ඉතා ම

අධික යැ. උගන්නා ළමයින්ගේ ද නීරස බෙහෙදකට මෙන් ආගමික පාඩමට ඇති එපාකමත් බොහෝ යැ. පැවිද්දන් අතරත්, ප්‍රාචීනභාෂාශාස්ත්‍රයනට වඩා දැන් දැන් ප්‍රතිචීනභාෂාශාස්ත්‍රයනටත් දැක්වෙන සැලකිල්ල ඉතා මහත් වේ. බොහෝ තුරුණු පැවිද්දෝ ධර්මවිනය ඉගෙනීමට කිසි ද සැලකිල්ලක් නො දක්වති.

ගිහි පැවිදි දෙපස ම අතරැ පිළිවෙත් පිරීම ගැන චින්තා මාත්‍රයක් වත් (දිනපතා තබා මාස්පතා වත්) උපදවන අය ඉතා ම හිඟවී ගෙන එති. ලෞකික විද්‍යාවන් හා ශිල්පයන් පුහුණුකොටැ ඒ මඟින් කීර්තියත් ධනයත් ප්‍රභුත්වයත් (= පුළුවන්කාරකමත්) ලබන්නටත් ඒ මඟින් දේශපාලන ව්‍යාපාරයට බැසැ මහාජනයා අතරැ අනුන් හසුරු වන ප්‍රධානයන් මෙන් පෙනී සිටීමටත් ඇති ලොල්කම කොතරම් ද කීවොත් ආගමික මෙහෙයන් හා පෞද්ගලික ප්‍රතිපත්තීන් මෙන් කරට ගත් හැම ව්‍යාපාරයක් යටින්, තමන් සිතා ගත් ලෞකිකාර්ථයට නඟනා හිණිමං බවට පෙරළෙන්නට නිර්ලජ්ජ වෙති. මෙසේ හෙයින් ගිහි පැවිදි උභය පක්ෂ අතර ම දින පතා කලහ විග්‍රහ විවාදයෝ පැනැ නඟිති. ශෝක මනස්තාප අවිශ්වාස ඊර්ෂ්‍යා ක්‍රෝධ මානාහංකාරයන් හා අසමගිත් සැහැසි හොර මැර ශඨ ප්‍රයෝගත් වැවෙති, වැඩෙති. මෙලොව වශයෙන් රටේ විනාශය ද පරලොව වශයෙන් ආත්මඝාතය ද සැලැසෙන්නේ මේ හෙයිනි. මේ බව නුවණින් සිතා බලා ගිහි පැවිදි කවුරුත් අපට අවුරුදු දෙදෙහසකටත් පෙර සිට උරුම වැ එන මේ උතුම් ආගම ඉගෙනීමත් පිළිපැදීමත් උනන්දුවෙන් කරන්නට උත්සාහ වඩත් වා !



# පූජා ච පූජනීයානං
# පිදිය යුත්තන් පිදීම

මවුපියෝ හිරු සඳු සම වෙති
ගුරුවරු නැණ පහන් ම වෙති
වැඩිහිටි හැම යහ ගුණ ඇති
පිදුමට නිසි උතුමෝ වෙති

ලොවෙහි අසම ගුණ කඳ හිමි
තිලොවග සම්බුදු මා හිමි
දහම ද සඟරුවන ද දැමි
තෙ රුවන වෙති හැම පුද හිමි

ඔබට සරණ දෙන තෙරුවන
මවුපිය ගුණ හඳුනා ගෙන
ගුරුවරුන් ගෙ ගුණ අපමණ
පුදමු එ හැම දැන කළ ගුණ !

ලොවෙහි පිදිය යුතු ඇත්තෝ
නිබඳ පිදුම් කළ යුත්තෝ
එ ලෙස පුදන පොඩි ඇත්තෝ
ගුණයෙන් සැළැකිලි ගත්තෝ

වැඩිහිටියන් නිතර පුදන
ගුණවතුනට කර බුහුමන
දියුණුවෙ රන් මාවත යන
දරුවෝ ම ය රටට කලණ

**– "ගුරු සීයා" විසිනි**



# ලොව සියලු දෙනාට ම එක සමානව ඇති අගනා ම සම්පත

**සිරි වජිරාරාමයේ ශාස්ත්‍රපති ගෞරවාර්හ**
**ඤාණසීහ ස්වාමීන් වහන්සේ විසිනි**

පින්වත් ළමයිනි, ලෝකයේ විවිධ බෙදීම් දක්නට ලැබෙනවා. ඉන් සමහරක් මෙසේ යි. පොහොසත්, මැදි ආදායම්, දුප්පත් හා අන්ත දුප්පත් රටවල්, ස්වාභාවික සම්පත් ඇති රටවල් හා නැති රටවල්, අධික සීත හා අධික උෂ්ණත්වය ඇති රටවල්, දියුණු හා නොදියුණු හෙවත් දියුණු වෙමින් පවත්නා රටවල්; කළු, සුදු, කහ ආදී වර්ණ අනුව බෙදුණු ජාතීන් වාසය කරන රටවල්; ජල ගැල්ම, සුනාමි, භූමි කම්පා ආදී විපත් බහුල හා එවන් විපත් විරල රටවල් යනාදී වශයෙනි. මෙසේ බෙදීම් ඇතත් එම රටවල වෙසෙන සෑම කෙනෙකුට ම මහලු, මැදි වයස්, තරුණ, ළමා හෝ ළදරු වේවා - එක සමාන දෙයක් ඇත. එනම් දින 365 කින් යුත් වර්ෂයක් සහ පැය 24 යුත් දිනයකි. වෙනත් වචනවලින් කියනවා නම්, පින්වත් ළමයිනි, එක සමාන කාල පරිච්ඡේදයකි. එනම් පැය 24 ක දිනයකි.

ලෝකයේ සෑම දෙයක් ම ඇති වෙනවා. නැති වෙනවා. ජල ගැලීම් ඇති වෙනවා; නාය යෑම් ඇති වෙනවා.

දහඩිය මහන්සියෙන් අවුරුදු ගණනාවක් තුළ ගොඩ නඟා ගත් දේ එක මොහොතකින් විනාශ වී යනවා. 2004 දී සුනාමියෙන් කොපමණ අලාභ හානි සිදු වුණා ද ? ලංකාවේ පමණක් 34,000 ක් පමණ මිනිසුන් මැරුණා. කොපමණ ගෙවල් කැඩී බිඳී ගියා ද ? එහෙත් මෙසේ අලාභ හානි සිදු වූ ඇතැම් පළාත්වලට දැන් ගිය විට සුනාමි උවදුරක් පැමිණියා ද කියා සිතා ගන්න බැරි තරම් එම ප්‍රදේශයන් වෙනස්කම්වලට බඳුන් වෙලා. විනාශ වූ ගොඩනැගිලි වෙනුවට අළුත් ගොඩනැගිලි දැන් දකින්න පුළුවන්. එයින් හැඟවෙන්නේ ඇතැම් දේ නැති වුණත් නැවතත් ඇති කර ගන්න පුළුවන් බව යි. එහෙත් නැති වුණොත් සදාකාලිකව ම නැතිවන දෙයක් තියෙනවා. කොපමණ වැර දැම්මත් ඒ නැති වුණ දේ නැවත ලබා ගන්න හැකියාවක් නැහැ. ඒ තමයි අපට ලැබී ඇති කාලය නමැති වටිනා සම්පත. එනම් අප කාටත් එක සේ වෙනසක් නො මැතිව ඇති පැය 24.

මෙම පැය 24, අපට ඕනෑ විදිහකට යොදා ගන්න නිදහස තියනවා. නිදාගන්න කැමති කෙනාට නිදාගන්න පුළුවන්. යහළු මිත්‍රයන් සමඟ විහිළු තහළුවෙන් ගත කරන්න කැමති කෙනාට එසේ ගත කරන්න පුළුවන්. රූපවාහිනියේ කාටුන් බල බලා ඉන්න පුළුවන්. ජංගම දුරකථනයෙන් විවිධ ක්‍රීඩාවල යෙදෙමින් කාලය ගත කරන්න පුළුවන්. හොඳ පොත් වගේ ම අසැබි පොත් කියවන්න පුළුවන්. පරිගණකය හරහා අන්තර්ජාලය මඟින් වැදගත් මෙන් ම නොවැදගත් දේ බලමින් කාලය ගත කරන්න පුළුවන්. මෙසේ කාලයෙන් නිසි ප්‍රයෝජන

ගන්නටත් කාලය නාස්තිකර දමන්නටත් අපට පුළුවන්. කාලය හොඳට පාවිච්චි කරන අය දියුණු වෙනවා. එවන් රටවලුත් දියුණු වෙනවා. කාලය අපතේ යවන අය හා එවන් රටවල් 'කාලය කන' හෙවත් 'කාලකන්නි' බවට පත් වෙනවා.

පින්වත් ළමයිනි, ලෝකයේ විශිෂ්ටයන් දෙස බලන්න. ඒ හැම දෙනා ම තමාට ඇති පැය 24 ඉතා හොඳින්, එසේ ම අර්ථවත්ව යොදා ගත් අය බව කියන්න පුළුවන්. ඒ සඳහා උසස් ම ආදර්ශය අපට ලබා දෙන්නේ අපගේ බුදුරජාණන් වහන්සේ යි. ළමා හා තරුණ කාලයේ සිදුහත් කුමරා ඒ වයසේ දී දැන ගත යුතු සියලු ම ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තා. එය ද ඉතා විශිෂ්ට අන්දමින්. ළමයින් දන්නවා නේ යසෝදරා කුමරිය දිනා ගැනීම සඳහා ශාක්‍ය වංශික රජවරුන් ඉදිරියේ පැවති තරගය. සෑම අංශයන්ගෙන් ම විශිෂ්ටයා වූයේ සිදුහත් කුමරා යි. විවාහ වී සියලු සැප සම්පත් වින්ද. පසුව වයස අවුරුදු 29 දී ඒ සියල්ල අතහැර සත්‍යය සොයා යන්නට එම බෝසත් කුමරාට සිතක් පහළ වුණා. ඒ වෙනුවෙන් කොපමණ වෙහෙසුණා ද කිවහොත්, එකල සිටි උසස් ප්‍රසිද්ධ පඬිවරුන් වන ආලාර කාලාම සහ උද්දක රාමපුත්ත ළඟට ගොස් අධි භාවනා ක්‍රම ඉගෙන ගත්තා. ඉන් අනතුරුව ලොව කිසි ම කෙනෙකු නො කළ අන්දමට දුෂ්කර ක්‍රියා කෙරුවා. අවසානයේ දී බෝධි මූලයේ පර්යංකයෙන් ඉඳ ගත්තේ ජීවිතය නැති වුණත් සත්‍ය නො දැන එම අසුනෙන් නො නැගිටින බවට ස්ථිර අධිෂ්ඨානයක් ඇති කර ගනිමිනි. අවුරුදු සයක් කාගේවත් පිහිටක් නොමැතිව

අරිය පරියේසනයේ යෙදීමෙන් පසුව අවුරුදු 35 දී බුදු බව ලබා ගත්තේ ස්වෝත්සාහයෙන් ම යි.

එවිට පාපී මාරයා පැමිණ ඔබ වහන්සේ ගේ අධිෂ්ඨානය දැන් සඵල වූ නිසා පිරිනිවන් පෑමට ආරාධනා කළා. එම අවස්ථාවේ දී බුදුරජාණන් වහන්සේ පැවසුවේ බුදු වීමේ අරමුණ ඉටු කර ගත්ත ද ලෝකාර්ථය සඳහා ව්‍යක්ත, විනීත, විසාරද, බහුස්සුත, ධම්මධර හා ධම්මානුධම්මපටිපන්න යන සගුණයෙන් යුත් භික්ෂු, භික්ෂුණී, උපාසක හා උපාසිකා යන සිවු වනක් පිරිසක් ඇති කිරීමෙන් පසුව පමණක් පිරිනිවන් පානා බව යි. ජීවිත අරමුණ වූයේ එය යි.

සිතා බලන්න, පින්වත් ළමයිනි, බුදු වුණ විට දුක, දුකට හේතුව, දුක නැතිකිරීම හා ඒ සඳහා යා යුතු මාර්ගය යන චතුරාර්ය සත්‍යය දැන ගත් ලෝකයේ විශිෂ්ටතම පුද්ගලයා බුදු රජාණන් වහන්සේ ය. එසේ සොයා ගත් සද්ධර්මය පටිසෝතගාමී (උඩුගං බලා යෑමක් වැනි) නිසා එම ධර්මය ප්‍රකාශ කිරීම වෙහෙස ගෙන දෙන්නක් බව උන් වහන්සේට ම වැටහී ගියා. එහෙත් ලෝකානුකම්පාව හේතු කොට ගෙන උන් වහන්සේ එම කාරියෙහි යෙදුණා. ඒ සඳහා පළමු වැනි පියවර බුද්ධගයාවේ සිට බරණැසට යෑමට තැබුවේ කිසිම හවුහරණක් නො මැතිවයි. පයට පාවහන් වත් හිසට මුතුකුඩ ඇල්ලීමක් වත් නො වී ය. එද පමණක් නොව වයස අවුරුදු 80 දී පිරිනිවන් පානා තෙක් ම අතින් පාත්‍රය හා කයෙන් සිවුර දැරීම හැර වෙන කිසිවක් නො වී ය. බුද්ධගයාවේ සිට බරණැසට දුර වර්තමාන භාවිතය අනුව කිලෝමීටර් 212 කි. දිනකට

කිලෝමීටර 30 ක් පමණ වඩිමින් එම ගමන හුදෙකලාව ගිය ද පිරිනිවන් පෑමට කුසිනාරාවට වඩින විට භික්ෂු සංඝයා දහස් ගණනින් වූහ. තනිව තැබූ මුල් පියවර එතරම් සාර්ථක වීමටත් බරණැස දී ප්‍රවර්තනය කරන ලද (පෙරළා යවන ලද) ධර්ම චක්‍රය අවුරුදු 2600කට පසුවත් නො නැවතී යෑමටත් දැක්විය හැකි හේතු රාශියකි. මෙයට එක් ප්‍රධානතම හේතුවක් නම් අප සියලු දෙනාටමත් සාධාරණ වූ පැය 24 ක දිනය හරියාකාරව සිය අභිලාෂයන් ඉටු කර ගැනීමට යෙදීම යි.

අපේ බුදු රජාණන් වහන්සේට පැහැදිලි දෛනික කාල චක්‍රයක් තිබුණි. සාමාන්‍යයෙන් පාන්දර 4.00 ට පමණ අවිදි වී ශරීර කෘත්‍යය කොට පැයක කාලයක් මහා කරුණා සමාපත්තියට සමවැද ඉන් අනතුරුව ලෝකය දෙස මනැසින් බලමින් අවලෝකනය කොට දුක නිවීම සඳහා උදව් කළ හැකි පුද්ගලයෙක් සිටියි නම් පාත්‍රා සිවුරු ගෙන පෙරවරු 6.00 න් පසුව එහි වැඩි සේක. නැතිනම් ගෙපිළිවෙලින් පිඬු සිඟා වැඩි සේක. උදේ වරුව පිණ්ඩපාත චර්යාව ආදියෙහි ගත කොට දහවල් 12.00 සිට සවස 6.00 වන තෙක් කාලය භික්ෂූන් වහන්සේ ගේ දහම් ගැටලු විසඳමින් හා විවේකීව හිඳ සවස් කාලයෙහි උදව් කළ හැකි පුද්ගලයකු සිටියා නම් එහි වැඩි සේක. එසේ ම දම් සභා මණ්ඩපයට වැඩ ගිහි පැවිදි, අන්‍ය තීර්ථක, රාජ මහාමාත්‍ය, දුගී ඕනෑම පුද්ගලයකු ගේ සිත්වල ඇති ප්‍රශ්නවලට විසඳුම් දෙමින් හා සැක තැන් දුරු කරමින් වටහා ගත් ධර්මය කියා දුන් සේක.

රාත්‍රී කාලය යාම තුනකට වෙන් කොට, ඉන් පස්වරු 6.00 සිට 10.00 තෙක් වූ පළමු යාමයෙහි නැවතත් පැමිණෙන ඕනෑම කෙනෙකු සමඟ ධර්ම සාකච්ඡා පවත්වමින් වැඩ සිටි සේක. 'මට ඉතා වෙහෙසයි,' කෙටියෙන් ප්‍රකාශ කර ධර්මය විස්තරාත්මකව කියා දෙන මෙන් සැරියුත්, මුගලන්, මහා කච්චායන ආදි මහ තෙරවරුන්ට පවරා ඒ අසල ම දෙපට සිවුර කොට්ටයක් ලෙසට නමා දිගා වූ අවස්ථා ඇතැම් සූත්‍ර දේශනාවල සඳහන් වේ. රාත්‍රී 10.00 පමණ සිට පෙරවරු 2.00 පමණ වූ මැද යාමය වෙන් කර තැබුවේ දෙව් බඹුන්ට ධර්මය දේශනා කිරීමට සහ ඔවුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට ය. පෙරවරු 2.00 සිට පෙරවරු 4.00 තෙක් වන අවසන් යාමයේ මුල් පැය සක්මනටත් දෙවැනි පැය සැතපීමටත් යොදා ගත් සේක. දවස තුළ දී යම් කිසි විවේකයක් ලද හොත් සමාධියට සම වැද සමාධි සුවය විඳිමින් සෑම විඩාවක් ම මඟ හරවා ගත් සේක. මෙසේ අප වෙනුවෙන් පිරිනිවන් පානා මොහොත තෙක් ම ලෝකාර්ථ චර්යාවේ යෙදීම හේතුවෙන් සිය අරමුණු ජීවිත කාලය තුළ දී ඉතා සාර්ථකව ඉටු කර ගැනීමට හැකි විය.

පින්වත් ළමයිනි, අපේ ශාස්තෘන් වහන්සේ එවැනි මහෝත්තමයාණ කෙනෙක්. ඔබ ද මින් පාඩමක් ගෙන තමා සතු පැය 24 අර්ථාන්විතව, ක්‍රමානුකූලව හා දින චක්‍රයක් අනුව ගත කිරීමට වෙහෙස දරන්න. එසේ කරමින් තමන්ට හා අනුන්ට එලදායි පුද්ගලයකු වීමට සිතට ගන්න. කාලය නමැති අපට ඇති අගනා ම සම්පතෙන් උපරිම ප්‍රයෝජනය ගැනීමට පුරුදු වන්න.



# කුසලේ බල මහිමය

එන්. ඩබ්ලිව්. තිලකරත්න මාමා විසිනි

ගුණ දම් වඩවමින් ගෙන යන දිවියකට
දෙවියොත් වඳිති දහමේ බල මහිමයට
ගියහොත් ඔබ කුසල් වඩමින් ඉදිරියට
බවයෙන් හවය ළංවේ නිවනේ මඟට

දුදනෝ නො ම දනිති කුසලේ බල මහිම
අකුසල්වල යෙදෙති දුදනන් ඇසුරේම
මෙය වටහා නොගතහොත් පහදු දහම
අවසන් නොවී විඳවති දුක් සසරේම

දහමෙහි හැසිරුණොත් ඔබ දහමින් රැකෙති
නුවණින් මෙය දකින අය යහපත දකිති
පවෙහි ගැලුණු සිත් ඇත්තෝ පවිටු වෙති
කුසලෙහි යෙදුණු ඇත්තෝ නිවන ම දකිති



# ආදර්ශයට ගතයුතු චරිතයක්

සිරි වජිරාරාමාධිකාරීව වැඩ විසූ අතිගරු පියදස්සි නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

ඉන්දියාවේ දුප්පත් ජනයාගේ යහපත සඳහා ඉතා දිගු කලක් මෙහෙකළ චාර්ලස් ඇන්ඩෲස්ගේ උදර චරිතය ළමයින් විසින් දැනගත යුත්තකි. චාර්ලස් ඇන්ඩෲස් එංගලන්තයේ කාලයිල් ඃස්රකසිකැ* නමැති ප්‍රදේශයේ දී 1871 පෙබරවාරි 12 වැනිද මෙලොව එළිය දුටු කෙනෙකි. ඒ මහතාගේ දෙමවුපියන් භක්තිමත් ක්‍රිස්තියානි භක්තිකයන් හෙයින්, කුඩා කාලයේ සිට ම, නැණවත් ගුණවත් ඉවසන සුලු හොඳ අම්මා කෙනකු ළඟ හා දේවගැතියකු වූ පියකු ළඟ හැදුණු ළමයාත් ඒ ආගමට හැරුණු කෙනෙක් විය. එහෙත් ඇන්ඩෲස්ගේ මව සහ පියා බොහෝවිට බයිබලයේ එන කීම්වලට ගරු නොකළහ. අනුගමනය නොකළහ. ඇන්ඩෲස්ගේ පියා දේවගැතියකු වුවත් බයිබලයේ සමහර කියුම් අතහැර දැමී ය. දේශනාවල දී නොකියා හැරියේ ය. සතුන් මැරීමේ, සතුන්ට වදදීමේ වැරැද්ද ගැන බයිබලයේ කියා නැත. බයිබලය සතුන් මරන්න අනුබල දෙයි.

ළඟදී ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ප්‍රසිද්ධ රැස්වීමකදී කථාවක් කළ ඉංග්‍රීසි ජාතික දේවගැතිතුමකුගෙන් සතුන්

මැරීම හරි ද කියා ප්‍රශ්න කළවිට "ඔව් වැඩක් නැතිව ප්‍රයෝජනයක් නැතිව මැරුවොත් එය වරදක් තමයි. ප්‍රයෝජනයක් පිණිස මැරුවාට වැඩි වැරැද්දක් නෑ. හැබැයි, සතාට වධා වද නොදී හිරිහැර නොකර මරාගත යුතුය"යි සිනා සෙමින් පිළිතුරු දුන්නේ ය. සභාවේ කවුරුත් සිනා සුණාහ. ඒ කථාව කිසිම නීතියකට ධර්මයකට නැති නිසා ය එසේ සිනාසුණේ. ඒ නිසා කවදාවත් හොඳ ළමයිනි, එබඳු බොළඳ කථා එබඳු පව් වැඩ කිසි දිනක නොකියන්න. නොකරන්න.

ඇන්ඩෲස්ගේ දෙමාපියෝ සතුන්ට මහත් දයාවක් අනුකම්පාවක් දැක්වූහ. බයිබලයේ කොහොම තිබුණත් සතුන්ට වදදීම නරක නිසා ඒ පින්වත්තු සතුන්ට අභය දුන්හ. ඇන්ඩෲස් කුඩා කාලයේ සිට ම හොඳින් හැදුණු ළමයෙකි. ඔහුගේ චරිතය හොඳ වුණේ කරුණාවන්ත ගුණවත් අම්මා නිසයි. හොඳ අම්මා නිසා චාර්ලස්ට සියලු යහපත සිදුවුණු බව චාර්ල්ස් දැන සිටියේ ය. පියා හොඳ කෙනෙකු නිසා පියාණන් කෙරෙහිත් චාර්ලස්ගේ ආදර ගෞරවය හොඳින් තිබුණි. ළදරු කාලයේ බොහෝ සෙයින් අම්මාගේ හෙවණේ ම ගත කළ චාර්ලස්ට තරමක ලොකු ළමයකු වූවාට පසු වඩ වඩා පියාගේ ආශ්‍රය ලැබුණි. අම්මාට වැඩ වැඩිවූ නිසාත් චාර්ලස් තරමක ලොකු ළමයකු වූ නිසාත් අම්මාගේ ආශ්‍රය ටිකක් අඩුවී ගොස් පියා සමඟ වැඩියෙන් ආශ්‍රය කරන්නට සිදුවූ බව චාර්ලස් ම කියයි. තමාගේ පියා ගැන චාර්ලස් මෙසේ කියයි.

"මගේ පියා බොහොම කරුණාවන්ත ය. මනුෂ්‍ය ධර්ම- හොඳ ගති මගේ පියා ළඟ බොහොම තිබුණා. දරුවන් වූ අප කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා කිසිවක් සඟවන්නේ

නැතිව කියා දුන්නා. ඉගැන්වුවා. මගේ පියා හැම දෙනාට ම ප්‍රිය කෙනෙකු වුණා.” දුම්රියෙන් ගමනක් යන විට රේල් පෙට්ටියේ සිටින, තමන් කවදවත් නොදුටු නාඳුනන අය සමගද හොඳින් කරුණාවෙන් කථාකොට ඔවුන් කෙරෙහි විශ්වාසය තබා නොයෙක් දේ ඔවුන්ට කියා දුන්නා පමණක් නොව නැති බැරි අයට මුදලින් පවා උපකාර කළා. කවුරුවත් උපකාරයක් ඉල්ලුවොත් සාක්කුවේ අත දමා තිබුණු දෙයක් දීම මගේ පියාගේ සිරිතයි. ඉතින් සමහරවිට කපටි මිනිස්සු ද මගේ පියාගේ අහිංසක කරුණාවෙන් වැඩ ගත්හ. ඇතැම්විට ගමනක් යනවිට මගේ අම්මා මගේ පියාට ගමනට උවමනා ප්‍රමාණයට වඩා සල්ලි දීමෙන් වැඩක් නැතැයි සිතුවා.

“හොඳ කථා අසන්නට හොඳ අයගේ රැස්වීම්වලට මගේ පියා මා රැගෙන ගිය වාර බොහෝයි. මගේ පියාත් මාත් අතර ඇතිවුණු සම්බන්ධය කොතරම් හොඳද කිවහොත් එතරම් හොඳ කරුණාවන්ත අනුකම්පා කරන සුලු තවත් කෙනෙක් මට නැති තරම් ය.”

එහෙත් මගෙන් දවසක් නොදැනුවත්වම වරදක් සිදුවුණා. දිනක් අපේ වැඩිමහල් නෑයෙක් ගෙදරට ඇවිත් යද්දී මාත් අයියාත් රැගෙන ලන්ඩන් නුවරට යන්න කැමතිවිය. ඉතින් එදම ආපසු එන පොරොන්දුව පිට දෙමවුපියන්ගේ අවසරය පරිදි අපි ගියෙමු. කලින් ලන්ඩන් නුවරට නොගිය මගේ සිතේ ලොකු අමුත්තක් සතුටක් ඇතිවුණා. ලන්ඩන් නුවරට ගියාට පසු “එදා රෑ එහි නැවතී නුවර අලංකාර බලා පසුදා ගෙදර යමු”යි අපේ නෑයා යෝජනා කෙළේ ය.

එහෙත් ඔහු එය අවංකව නොකර ‘රේල්ල වැරදුණා’ කියා අපේ ගෙදරට විදුලි පණිවුඩයක් යවා ‘මෙය රහසක් හැටියට

තබා ගන්නැ'යි කියා අපවත් පොරොන්දු කර ගත්තා. ඉතින් මට එවෙලාවේ මේ බොරුවක්ය, වැරැද්දක්ය යන බව සිතුණේ නැහැ. මමත් අයියා සමග කාටවත් නොකියන ලෙස පොරොන්දුවීමි. පසුව අප කළේ බොරුවක් ය වංකකමක් ය යන බව මට වැටහුණා. අහෝ ! එයින් මට මගෙන් ම ලැබුණු නින්දව සිතෙන් අස්ව ගියේ මාස ගණනකට පසුව ය. වෙන වෙන අදහස් සිතට ඒමෙන් අර අදහස යටපත්ව ගියා. යටපත්ව ගියත් ඒ වරද මගේ සිතේ තබා ගිය කැළල මැකුණේ නැත. පොරොන්දුව පරිදි මම රහස මවුපියන්ටවත් හෙළි කෙළේ නැත."

හොඳ ළමයින් ද චාර්ලස් ඇන්ඩෘස් තුමාගේ මේ කථාවෙන් පාඩමක් ඉගෙනගන්න. අවංක වන්න. බොරු නොසිතන්නට, බොරු නොකියන්නට, බොරු නොකරන්නට තරයේ ම සිතට ගන්න.

**(මතු සබඳි)**

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

## නපුරු සිතුවිලි සැමද දුක් දේ

**මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා**
**මනසා චේ පදුට්ඨේන - භාසති වා කරෝති වා**
**තතෝ නං දුක්ඛමන්වේති - චක්කංව වහතෝ පදං**

**(ධම්මපදය - යමක වග්ගය)**

සිතේ පහළ වන සිතිවිලි (චෛතසික) සිත පෙරටු කොට, සිත ශ්‍රේෂ්ඨ කොට ඇත්තේ ය. සිතින් ම උපදනේ ය. යමෙක් කිලිටි සිතින්, යමක් කියයි නම්, කරයි නම්, ගැල අදිනා ගොනු පසුපස යන රෝදය මෙන් ඔහු පසු පස්සේ දුක ලුහු බඳී.



# අපි වෙමු හොඳ ළමයි

පුෂ්පා ජයවර්ධන නැන්දා විසිනි

රුවින් පැහැයෙන් දුළ
සුපුල් සුමිහිරි සුවඳැති
මලක් මෙන් මුදු ගුණ පිරි
ළමයි වෙමු අපි ලොවට සුව දෙන

අනුන් කළ කී දේ
නොසොයා කිසිත් ඇද කුද
තමනට හැකි ලෙසින්
කරනු යහපත සැමට අදරින්

ලද දෙයින් සෑහී
අන් සතු දෙයෙහි නො ඇලී
දුන් දෙයින් සතුටු ව
පුරුදු වෙමු අපි පුරමු යහගුණ

හිස් බසත් බොරුවත්
කේලම් පරොස් වචනත්
අනුනටත් අපටත්
අවැඩ සලසනු නිසැක කවදත්

දීමෙහි ඇලීමත්
මෙත් සිතුවිලි වැඩීමත්
අනුන් සැපතෙහි දී
යහපති සතුටු වීමත්

තිසරණයෙහි ළැදී
කලණ ඇසුරෙහි නිබැඳී
දිරිය වීරිය දී
යන්න පෙරට ම දරුව වොරැඳී



# කණ්හ ජාතකය

**කොළඹ විශාඛා විදුහලේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**

දිනෙක දෙව්රම් වෙහෙර දම් සභාවට රැස්වූ භික්ෂූන් වහන්සේලා අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අසම සම ගුණ මෙන් ම උන්වහන්සේගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳව කතා කරමින් සිටියහ. "අප භාග්‍යවතුන් වහන්සේට ඉහළින් ප්‍රාතිහාර්ය පෑමට කිසිම සමතකු නොමැති බවට ඔබ නොදන්නෙහිදැ"යි එක් භික්ෂුවක් විමසී ය.

"එය සත්‍යයකි. මක්ඛලිගෝසාල වැනි ශාස්තෘවරුනටත් ප්‍රාතිහාර්යයන් පෑමට නොහැකි වූවා නොවේදැ"යි අනෙක් භික්ෂුවක් පැවසී ය. මෙම කතාව පිළිබඳ තොරතුරු ඇසූ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ, ප්‍රාතිහාර්යයන් පිළිබඳව විශේෂයෙන් යමා මහ පෙළහර මුල්කොට කණ්හ ජාතකය දෙසූ සේක. ඒ පෙර කල තම මෑණියනට සැළකීම සඳහා ස්ථිර අධිෂ්ඨානයෙන් යුතුව ගවයකු විසින් පෑ වික්‍රමය පිළිබඳව කියැවෙන ජාතක කථාවයි.

ඈත අතීතයේ බඹදත් රජු කල අප මහ බෝසතාණෝ ගව ජාතියක උපත ලදහ. අඟ හිඟකම් පිරි ජීවිතයක් ගත

කළ එක් තැනැත්තියක් හැකි ලෙස මේ වසු පැටියාට කවා පොවා, 'ආර්යක කාල' ලෙස නම් තබා, තම පුතකු ලෙස හදා වඩා ගත්තා ය. ආර්යක කාල යහපත් ගතිගුණ ඇති වසු පැටවෙක් විය. ගම්වැසියෝ ද වසු පැටවාට ආදරය කළහ.

තරුණ වියට පත් ආර්යක කාල තම මැණියන් ජීවත්වීමට දරන වෑයම දැක කෙසේ හෝ ඇය දුප්පත් බවින් මුදවා ගත යුතු යැයි අදිටන් කර ගත්තේ ය. මේ බෝසත් ගවයා, තමාට සරිලන මෙහෙවරක් සෙවූ මුත් කිසිදු ගම්වැසියකු ඔහු වැඩෙහි යෙදවූයේ නැත. එහෙත් ආර්යක කාල තම අධිෂ්ඨානය අත් නොහැර, හී සෑම, දර ඇදීම වැන්නක නිරත විය හැකි දැයි සොයා බැලී ය. ගැල් නායකයකුගේ ගැල් පන්සියයක් මඩෙහි එරී ඇති නිසා, තම ගවයන් යොදා ගොඩට ඇදීමට තැත් කළත්, එය ව්‍යර්ථ වන අයුරු ආර්යක කාල බලා සිටියේ ය. ඔහු දුටු ගැල් නායකයා, "මේ ගවයාට ගවයින් පන්සියයකගේ වීර්යය ඇති බව පෙනේ. මොහු ලවා මගේ ගැල ගොඩට ඇදිය හැකි නොවේදැ"යි සිතුවේ ය. වටපිට බැලූ ගැල් නායකයා, ආර්යක කාලගේ ස්වාමියකු නොදුටු බැවින් නාස් ලණුවෙන් ඇද්දේ ය. බෝසත් ගවයා නොසෙල්වී සිටියේ ය. කහවුණු දහසකට ගැල් පන්සියය ගොඩට අදින ලෙස ගවයාගෙන් ඉල්ලා සිටියේ ය. තම මව දුප්පත්කමින් මුදවා ගැනීමට හැකිවේයැයි සිතූ ආර්යක කාල අධිෂ්ඨානයෙන් යුතුව, සිතෙහි මෙන් ම ගතෙහි වීර්යය එක්තැන් කොට ගැල් පන්සියය ගොඩට ඇද්දේ ය. ගම් වැසියෝ මේ කිනම් ප්‍රාතිහාර්යයක් දැයි සිතූහ.

ලොබ වූ සිතින්, ගැල් නායකයා කහවුණු පන්සියයකින් යුත් පොදියක් ගවයාගේ කරෙහි බැන්දේ ය. මෙය දැනගත් ගවයා ගැල් පන්සියයට යෑමට නොහැකි ලෙස මඟ අවුරා නොසෙල්වී සිටියේ ය.

තම වරද වටහා ගත් ගැල් නායක තෙමේ තවත් කහවුණු පන්සියයක් එක්කර කරෙහි බැන්දේ ය. එවිට ඉතා වෙහෙසට පත්වී සිටිමුත්, දිවගොස් මැණියනට කහවුණු දහස ලබාදුන් ආර්යක කාල දුටු මව මෙපමණ වෙහෙසවීමට සිදුවූ කරුණ ගම්වැසියන්ගෙන් දැනගත්තා ය. ඕ තම පුතු උණු පැනින් නාවා, කවා පොවා සුවපත් කළා ය. එතැන් පටන් දෙදෙන සතුටින් සැපවත් ජීවිත ගත කළහ. මවු තොමෝ තම ආයුෂ අවසන්ව කර්මානුරූපව මියගියා ය.

එකල බෝසතාණන් ලෙසින් මෙන් ම මෙකල බුදුරජාණන් ලෙස අධිෂ්ඨාන බලයෙන් යමා මහ පෙළහර වැනි අසමාන ධුර දරනා බැව් පහදා දුන් සේක.

ආර්යක කාල ගවයා එකල තමන් වහන්සේ බවත්, මැණියෝ උප්පලවණ්ණා මෙහෙණින් වහන්සේ බවත් වදාළ සේක.



# උදා සිරි මහිම

පාඨශාලාචාර්ය
ඩී. පී. බී. ඇල්ලේපොල සූරීන් විසිනි

බොදු ළමා පිළිවෙ ත
වෙතැ යොමා ඔබ නෙත සිත
“බොදු ළමයා” බල ත
වහා වැටහේ කරුණු සැක නැත

ළයට පෙනහලුව ට
පිවිතුරු බවක් පළ කො ට
දිගාසිරි විඳුම ට
පහන් දොර වියි අපේ පිහිට ට

විහඟ කැල රැව් දෙන
සුසුදු හිරු රැස් විහිදෙන
සුවඳැති නල හමන
උදය සැපතෙකි අපට අපමණ

හිමිදිරි උදා සන
පිබිදී තුටින් ඉපිලෙන
දරුවනි, ඔබ දියුණ
නියති, නැඟැ එන ළහිරු විලසින